# චුල්ලකම්මවිභංග සූත්‍රය
(ම.නි., iii, 432 පිට)

# කර්මය

කර්මය යනු යමක් කිරීමයි. බුදුදහමට අනුව 'කර්මය යනු චේතනාවයි. සිතා යමක් කයින් වචනයෙන් හෝ සිතින් කරයි ද එය කර්මයයි (*චෙතනාහං භික්ඛවෙ කම්මං වදමි, චෙතයිත්වා කම්මං කරොති කායෙන වාචාය මනසා,* නිබ්බේධික සුත්ත, අං.නි. vi, 208 පිට). ඒ අනුව යමක් කර්මය වන්නේ සිතින් සිතා කයින් වචනයෙන් සිතින් එය සිදු කිරීමෙනි කර්මය වූ කලි ආධ්‍යාත්මික ශක්ති විශේෂයකි. කර්ම අදෘශ්‍යමාන නමුදු ඉන් ජනිත වන කර්මඵලය දෘශ්‍යමාන වූවකි. කර්මයට අදළ වූ චේතනාව පටිච්චසමුප්පන්න වූ චෛතසික ධර්මයකි. එය ස්පර්ශ, වේදනා, සංඥා, මනසිකාර සමග සම්බන්ධිත වූ ධර්මයකි. යමක් කර්මයක් බවට පත්වන්නේ එය සචේතනාත්මක ව කිරීමෙනි. එසේ නොවුණු විට පාප හෝ පුණ්‍ය සිදු නොවේ (*නත්ථි පාපං අකුප්පතො).* කුසල - අකුසල වශයෙන් කර්මය දෙවැදෑරුම් වන අතර ඊට අමතරව බුදුදහමෙහි සූත්‍ර පිටකයෙහි සුකට - දුක්කට, සෙවිතබ්බ - අසෙවිතබ්බ, සුක්කධම්ම - කණ්හධම්ම, පුඤ්ඤ - පාප, හබ්බ - අහබ්බ යන පද ව්‍යවහාර වේ. මෙහිලා කුසල යනු තමාටත් අනුන්ටත් යහපත හිතසුව පිණිස පවත්නා ක්‍රියා ය. අකුසල යනු තමාටත් අනුන්ටත් අයහපත අවැඩ පිණිස පවත්නා ක්‍රියා ය.

සර්වඥතා ඥානය සාක්ෂාත් කිරීමත් සමග ලැබුණු චුතූපපාත ඤාණය මගින් සත්ත්වයා කර්මානුරූපව යළි භවයක ප්‍රතිසන්ධිය ලබන ආකාරය පිළිබඳව බුදුරජාණන් වහන්සේට පැහැදිලිව අවබෝධ විය. ගෙවල් දෙකක් අතර සිටින ඇස් ඇති පුරුෂයකුට එක් නිවසකින් නික්ම තවත් නිවසකට පිවිසෙන තැනැත්තකු මැනැවින් දර්ශනය වන්නාක් මෙන් බුදුරජාණන් වහන්සේට සත්ත්වයන් එක් භවයකින් ච්‍යුත වී නැවත භවයක ප්‍රතිසන්ධි ලබන ආකාරය මැනැවින් ප්‍රත්‍යක්ෂ විය. එහි දී උපදින සත්ත්වයන් බොහෝ දෙනකු දුගතිගාමී වන අයුරු දැක ලෝක සත්ත්වයා කෙරෙහි බලවත් සංවේගයක් හටගත් බුදුරජාණන් වහන්සේ මේ තත්ත්වය ලෝකයාට අවබෝධ කරලීමට ඉමහත් වෙහෙසක් දරමින් ධර්මදේශනා කළහ. උන් වහන්සේගේ මූලික අපේක්ෂාව වූයේ ස්වර්ග මාර්ගය හා මෝක්ෂ මාර්ගය ලොවට දේශනා කිරීමයි. එහිලා පෘථග්ජනයන් සේඛයන් කරලීමත් සේඛයන් අසේඛයන් කිරීමත්, අසේඛයන් පිරිනිවන තෙක් සුවසේ වෙසෙනු දැකීමත් බුදුරදුන්ගේ අපේක්ෂාව විය. මේ සඳහා අපාගත වීමට සිටියවුන්ට කම්මස්සකතා සම්මා දිට්ඨිය ලබා දී ඔවුන් සුගතියෙහි පිහිටුවීමට ද කම්මස්සකතා සම්මාදිට්ඨිය ලැබූවන්ට චතුසච්ච සම්මා දිට්ඨිය ලබා දී ඔවුන් නිවනෙහි හික්මවීමට ද අනුශාසනා කළහ. බුදුරජාණන් වහන්සේ ලොව පහළ වන සමය වන විට ද ඇතැමුන් යළි ඉපදීම හා කර්මය පිළිබඳ විශ්වාස කොට තිබුණ ද ඔවුන් එය විශ්වාස කළේ ශාස්වත දෘෂ්ටිය මත පිහිටා ය. බුදුදහමෙහි පවත්නා විශේෂත්වය වන්නේ ශාස්වත හා උච්ඡේද යන දෘෂ්ටි දෙකෙහි ම නොපිහිටා පටිච්ච සමුප්පාදය හෙවත් හේතුඵල දහම මත පදනම් ව කර්මය විග්‍රහ කිරීමයි.

කර්මය හා ඉන් ජනිත වන ඵලය පිළිබඳව පරතෙරට සිතා අවසන් කළ නොහැක. එබැවින් කර්ම මාතෘකාව වූ කලි අචින්තනීය වූවක් බව සඳහන් වේ (අචින්තෙය්‍ය සුත්ත, අ.නි.). රහත් උතුමකුට වුව ද කර්මය පිරිසිඳ දත නොහැක. එය සම්මා සම්බුදුවරයකුට ම විෂයය වූවකි. එසේ වුව ද **තමා කර්මය ස්වකීය කොට ඇත්තෙක්, කර්මය දායාද කොට ඇත්තෙක්, කර්මය ජනිත කොට ඇත්තෙක්, කර්මය ඥාති කොට ඇත්තෙක්, කර්මය පිළිසරණ කොට ඇත්තෙක් බවත් යහපත් වූ හෝ අයහපත් වූ හෝ යම් කර්මයක් කරයි ද එය දායාද කොට ඇත්තෙක් බවත් ගිහි පැවිදි සැවො ම නිතර සිහි කළ යුතු බව** අභිණ්හ පච්චවෙක්ඛණ සූත්‍රයෙහි සඳහන් වේ (*කම්මස්සකොම්හි කම්මදයාදෙ කම්මයොනි කම්මබන්ධු කම්මපටිසරණො යං කම්මං කරිස්සාමි කල්‍යාණං වා පාපකං වා තස්ස දයාදෙ භවිස්සාමීති අභිණ්හං පච්චවෙක්ඛිතබ්බං....,* අභිණ්හපච්චවෙක්ඛණ සුත්ත, අං.නි. III).

බුදුරදුන් දිවමන් සමයෙහි කර්මය පිළිබඳ ව භාරතයෙහි පැවැති ප්‍රධාන වාද තුනකි. එනම්,

1. පුබ්බේකතහේතුවාදය
2. ඉස්සරනිම්මාණවාදය
3. අහේතු අප්පච්චයවාදය (තිත්ථායතන සුත්ත, අං.නි. III, 310 පිටුව)

පුබ්බේකතහේතුවාදය යනු සියල්ල පෙර කර්මයේ ප්‍රතිඵල වශයෙන් සිදු වේය යන අදහසයි. මෙම අදහස ගත්තවුන් අතර නිගණ්ඨ නාතපුත්ත හෙවත් ජෛන මහාවීර ප්‍රධාන ය. ඉස්සරනිම්මාණවාදය යනු ලෝක නිර්මාපක ඊශ්වරයාගේ කැමැත්ත පරිදි සියලු යහපත - අයහපත සිදු වේ ය යන අදහසයි. සියල්ල කිසිදු හේතුඵල දහමකින් තොර ව ඉබේ ම සිදුවේය යන අදහස අහේතුකඅප්පච්චයවාදයෙන් කියැවේ. මක්ඛලී ගෝසාල මෙම අදහසෙහි දැඩි ව එල්ඹ ගෙන සිටියෙකි. එබැවින් මක්ඛලී ගෝසාල තරම් අනර්ථකාරී අන් කිසිවකු නොමැති බව බුදුසමයෙහි සඳහන් වේ. මෙම වාද තුනට ම පදනම් වී ඇත්තේ ශාස්වත හෝ උච්ඡේද දෘෂ්ටි ය. එබැවින් බුදුරජාණන් වහන්සේ මේ වාද තුන ම බැහැර කොට හේතු ඵල දහමට අනුකූල ව අනාමත්මවාදය මත පදනම් ව ලොව ක්‍රියාත්මක වන කර්මඵලවාදයක් හඳුන්වා දුන්හ.

## චූල්ලකම්මවිභංග සූත්‍රය

මජ්ඣිම නිකායේ චූල්ලකම්මවිභංග සූත්‍රයට අනුව දිනක් බුදුරදුන් වෙත පැමිණි තොදෙය්‍යපුත්ත සුභ මානවකයා 'මිනිසත්බව ලැබූ මිනිසුන්ගේ උස් පහත් වශයෙන් පවත්නා වෙනසට හේතුව කුමක්දැයි විචාළේය.

ඒ අනුව ගෞතමයන් වහන්ස,

1. අල්ප ආයුෂ ඇති අය දක්නා ලැබෙත් (*දිස්සන්ති හි භෝ ගොතම, මනුස්සා අප්පායුකා*).
2. බොහෝ ආයුෂ / දිගාසිරි ඇති අය දක්නා ලැබෙත් (*දිස්සන්ති දීඝායුකා*).
3. බොහෝ ආබාධ ඇති අය දක්නා ලැබෙත් (*දිස්සන්ති බව්හාබාධා*).
4. අල්පාබාධ ඇති අය දක්නා ලැබෙත් (*දිස්සන්ති අප්පාබාධා*).
5. දුර්වර්ණ අය දක්නා ලැබෙත් (*දිස්සන්ති දුබ්බණ්ණා*).
6. වර්ණවත් අය දක්නා ලැබෙත් (*දිස්සන්ති වණ්ණවන්තො*).
7. අල්ප යශස් ඇති අය දක්නා ලැබෙත් (*දිස්සන්ති අප්පේසක්ඛා*).
8. මහත් යශස් ඇති අය දක්නා ලැබෙත් (*දිස්සන්ති මහේසක්ඛා*).
9. අල්පභෝග ඇති අය දක්නා ලැබෙත් (*දිස්සන්ති අප්පභොගා*).
10. මහත්භෝග ඇති අය දක්නා ලැබෙත් (*දස්සන්ති මහාභොගා*).
11. පහත් කුලීන අය දක්නා ලැබෙත් (*දිස්සන්ති නීචකුලීනා*).
12. උසස් කුලීන අය දක්නා ලැබෙත් (*දිස්සන්ති උච්චාකුලීනා*).
13. දුෂ්ප්‍රාඥ අය දක්නා ලැබෙත් (*දිස්සන්ති දුප්පඤ්ඤ*).
14. ප්‍රඥාවත් අය දක්නා ලැබෙත් (*දිස්සන්ති පඤ්ඤවන්තෝ*).

මෙලොව මිනිස්බව ලද මිනිසුන් අතර පවත්නා මෙම වෙනසට හේතු කවරේදැයි සුභ මානවකයා විමසීය.

ඊට බුදුරදුන්ගේ පිළිතුර වූයේ මෙම උස් පහත් භේදයට හේතුව කර්මය බවත් කර්මය සත්ත්වයා හීන ප්‍රණීත වශයෙන් බෙදා ඇති බවත් ය (*කම්මස්සකා මානව, සත්තා කම්මදායාද, කම්මයොනි කම්මබන්ධු කම්මපටිසරණා. කම්මං සත්තෙ විභජති යදිදං හීනප්පණීතතා,* ම.නි. III, චූල්ලකම්මවිභංග සූත්ත, 432 පිට). අනතුරුව එම වෙනස්කම්වලට හේතු සවිස්තරාත්මක ව විස්තර කළහ. ඒ අනුව,

- ▲ ප්‍රාණඝාතය හේතුවෙන් ආයුෂ අඩු වන බව ද,
- ▲ ප්‍රාණඝාතයෙන් වැළකීමෙන් ආයුෂ වැඩි වන බව ද,
- ▲ සතුන්ට හිංසා කිරීමෙන් බොහෝ ආබාධ ඇති වන බව ද,
- ▲ සතුන්ට හිංසා කිරීමෙන් වැළකීමෙන් ආබාධ අඩු වන බව ද,
- ▲ ක්‍රෝධය බහුල වීමෙන් දුර්වර්ණ වන බව ද,
- ▲ ක්‍රෝධ නොකිරීමෙන් ප්‍රියජනක (වර්ණවත්) වන බව ද,
- ▲ ඊර්ෂ්‍යාව හේතුවෙන් අල්පේශාක්‍ය වන බව ද,
- ▲ ඊර්ෂ්‍යා නොකිරීමෙන් මහේශාක්‍ය වන බව ද,
- ▲ දන් නොදීම හේතුවෙන් අල්පභෝග වන බව ද,
- ▲ දන් දීම හේතුවෙන් මහාභෝග වන බව ද,
- ▲ මානාධික වීමෙන් පහත් කුලයන්හි උපත සිදු වන බව ද,

- ▲ මානාධික නොවීමෙන් උසස් කුලයන්හි උපත සිදු වන බව ද,
- ▲ විමසා බලා ක්‍රියා නොකිරීමෙන් නුවණ මද වන බව ද,
- ▲ විමසා බලා ක්‍රියා කිරීමෙන් නුවණ ඇති වන බව ද

සඳහන් කර ඇත.

මෙලෙස සත්ත්වයාගේ ජීවන ක්‍රියාවලියට කර්මය සුවිශේෂී බලපෑමක් සිදු කරන නමුදු කර්මයෙන් සියල්ල සිදුවේ ය යන්නක් බුදුදහමින් නොකියැවේ. එහි දී ලෝකයේ සජීවී - අජීවී සියල්ල සිදුවන නියාම ධර්ම පහක් හඳුන්වා දී ඇත. එනම් උතු නියාම, බීජ නියාම, කම්ම නියාම, ධම්ම නියාම, චිත්ත නියාම වශයෙනි. කර්මය යනු මෙම නියාම ධර්ම පහෙන් එකක් පමණි. තවද සත්ත්වයන්ට සැපදුක් අත්විඳීමට හේතු අටක් පිළිබඳ ව සංයුක්ත නිකායෙහි මොළිය සීවක සූත්‍රයෙහි (සං.නි. IV, 436 පිට) දක්වේ. එනම්ඃ වාතය, පිත, සෙම, සන්නිපාතය (තුන්දෙස් එක්වීම), ඍතු වෙනස්වීම, විෂම හැසිරීම, උපක්‍රම, බලවත් අකුසල කර්මයන්හි විපාක වශයෙන්. මෙම හේතු අට අතුරින් සැපදුක් ජනිත වීමට හේතුවන කරුණක් ලෙස කර්මය දක්වා ඇති අතර එය එක ම හේතුව නොව එක් හේතුවක් පමණක් බව ද වටහා ගත යුතු ව ඇත. ගිරිමානන්ද සූත්‍රයෙහි (අ.නි. VI, 198 පිට) රෝග හටගැනීමට හේතු වශයෙන් ද මෙම කරුණු අට එලෙසින් ම දක්වේ. එයින් ද පැහැදිලි වන්නේ රෝගපීඩා ඇතිවීමට බලපාන කරුණු අතර කර්මය එක් කරුණක් පමණක් බවයි.

කර්මය තෙවැදෑරුම් වශයෙන් බුදුසමයෙහි විස්තර වේ. එනම් කාය කර්ම, වචී කර්ම හා මනෝ කර්ම වශයෙනි. බුදුරදුන් සමයෙහි ඇතැම් ආගම්වල මෙය කාය දණ්ඩ, වචී දණ්ඩ මනෝ දණ්ඩ වශයෙන් විග්‍රහය කොට තිබුණි. බුදුරජාණන් වහන්සේ 'දණ්ඩ' යන්න බැහැර කොට ඒ වෙනුවට 'කම්ම' (කර්ම) යන්න හඳුන්වා දුන් අතර මෙම කර්මත්‍රය අතුරින් මනෝ කර්මය වඩාත් ප්‍රබල බව දීඝතපස්සී නම් ජෛන තැනැත්තාට දේශනා කළහ (*ඉමෙසං ඛො තපස්සී තිණ්ණං කම්මානං........ මනොකම්මං මහාසාවජ්ජතරං පඤ්ඤපෙමි පාපස්ස කම්මස්ස කිරියාය පාපස්ස කම්මස්ස පවත්තනියා, නො තථා කායකම්මං නො තථා වචීකම්මං,* ම.නි.I). ඇතැම් කායික හා වාචසික ක්‍රියාවන්ට වඩා මනෝ කර්මය බලවත් බවත් එහි ප්‍රතිඵල වශයෙන් ඇතැමුන් ලොවට මහත් අනර්ථයන් සිදු කළ බවත් ධර්මයෙහි දක්වේ. තව ද සත්ත්වයා සිදු කරන සියලු ක්‍රියාවන්ට මනස ප්‍රධාන වන බව ද අවධාරණය කොට තිබේ. ප්‍රදුෂ්ඨ වූ සිතින් යුතු ව කරන ක්‍රියා හා කතා තුළින් ගොනා පිටුපස එන රිය සක මෙන් (*චක්කං'ව වහතො පදං*) සත්ත්වයාට දුක් විඳීමට සිදු වන බවත්, ප්‍රසන්න සිතින් යුතු ව කරන ක්‍රියා හා කතා තුළින් තමා පිටුපස එන ඡායාව මෙන් (*ඡායා'ව අනපායිනී*) සත්ත්වයාට සැප විඳීමට හැකි වන බවත් ධම්මපදයෙහි සඳහන් වේ (ධ.ප. යමක වග්ග, 1-2 ගාථා).

තවද අහසෙහි සිටියත් මුහුද මැද සිටියත් පර්වත කුහරයක සිටියත් ලොව කොතැන සිටියත් කර්මයෙන් ලැබෙන විපාකයෙන් නොමිදිය හැකි බව සඳහන් වේ.

*න අන්තලික්ඛෙ න සමුද්දමජ්ඣෙ න පබ්බතානං විවරං පවිස්ස,*
*න විජ්ජති සො ජගතිප්පදෙසෙ යත්ථට්ඨිතං මුඤ්චෙය්‍ය පාපකම්මා.* (ධ.ප.)

බුදුදහමෙහි සඳහන් බොහෝ ඉගැන්වීම්වලට කර්මය ඇතුළත් ව තිබේ. ඒ අතර පුනර්භවය, පටිච්චසමුප්පාදය, ස්කන්ධ විග්‍රහය, කුසල අකුසල විග්‍රහය, නාම රූප, සතර ආහාර, ආයතන, ආර්ය අෂ්ටාංගික මාර්ගය, චතුරාර්ය සත්‍යය, නිවන ප්‍රධාන ය. පුනර්භවයට හේතුවන ප්‍රතිසන්ධි චිත්තය සමග කර්මය සම්බන්ධ ව පවතී. පටිච්චසමුප්පාදයෙහි සංඛාර නමින් දක්වෙන්නේ කර්මයයි. ඊට අනුව සත්ත්වයා කර්ම සිදුකරන්නේ අවිද්‍යාව නිසයි. පංචඋපාදනස්කන්ධ විග්‍රහයෙහි සංඛාර ස්කන්ධයට කර්මය ඇතුළත් වේ. 'කුසල - අකුසල' සත්ත්වයා විසින් සිදු කරනු ලබන කර්මය දෙකට බෙදු තිබේ. නාම රූප විග්‍රහයෙහි ලා එය නාම යටතට ඇතුළත් වේ. සතර ආහාරයෙහිලා මනො සංචේතනාහාරය යටතට ගැනේ. ආයතන විග්‍රහයෙහි ලා බාහිර ආයතන වන රූප, ශබ්ද, ගන්ධ, රස, ස්පර්ශ, ධර්ම ඇසුරින් සංචේතනය ක්‍රියාත්මක වේ. ආර්ය අෂ්ටාංගික මාර්ගය වූ කලි කර්මක්ෂය කිරීමේ ආර්ය මාර්ගයයි. එහි සම්මා දිට්ඨියෙහි විශේෂයෙන් කර්මය පිළිබඳ ව දක්වේ. සම්මාදිට්ඨිය වූ කලි දෙවැදෑරුම් ය. එනම් සාශ්‍රව වූ පුණ්‍යාභාගීය සංඛ්‍යාත කර්මඵල ඇදහීම පිළිබඳ ලෞකික සම්මා දිට්ඨිය හා චතුසච්ච සම්මාදිට්ඨි නම් වූ ලෝකෝත්තර සම්මා දිට්ඨියයි. මින් පළමුවැන්නෙන් කියැවෙන්නේ කර්මස්සකතා සම්මාදිට්ඨියයි. එනම්, දුන් දෙයෙහි විපාක ඇත, යාගයෙහි විපාක ඇත..., ආදී වශයෙන් දක්වෙන කර්මඵල විශ්වාස කිරීම් වශයෙන් පවත්නා සම්මාදිට්ඨිය මීට අයත් ය.

සත්ත්වයා මිථ්‍යා දෘෂ්ටියෙන් මුදවා සම්මා දිට්ඨියෙහි පිහිටුවාලීම සඳහා බුදුදහම නිබඳව අනුශාසනා කරනු දක්නට ලැබේ. ඒ සඳහා දේශිත අනුශාසනා පෙළ දහමෙහි නිතර හමුවේ. යහපත කරන්නාට යහපත් ප්‍රතිඵල ද, අයහපත කරන්නාට අයහපත් ප්‍රතිඵල ද අත්විඳීමට සිදුවන බව බුදුසමය අවධාරණය කරයි (*කල්‍යාණකාරී කල්‍යාණං - පාපකාරී ච පාපාකං*, ඉසයොසමුද්දක සූත්‍රය, සං.නි. I, 404 පිට). වපුරන්නේ යම් බීජයක් ද ඵල වශයෙන් ලැබෙන්නේ ඊට සමාන ඵලයි. එමෙන් ම කරන කර්මයන්ට අනුරූපව ප්‍රතිඵල ලැබේ (*යාදිසං වපතෙ බීජං - තාදිසං හරතෙ ඵලං*). තවද කර්මය නිසා ලෝකය පවත්නා බවත් කර්මය නිසා ප්‍රජාව ජීවත් වන බවත් ගමන් කරන රථයක රෝදය නොගැළවීමට සවිකරන කඩ ඇණය ලෙසින් සත්ත්වයා කර්මයට බැඳී පවත්නා බව ද සඳහන් වේ.

*කම්මනා වත්තති ලොකො - කම්මනා වත්තති පජා,*
*කම්මනිබන්ධනා සත්තා - රථස්සාණීව යායතො.*

(සු.නි. වාසෙට්ඨ සුත්ත, 657 ගාථාව)

මෙබඳු තත්ත්වයක් මත කයින්, වදනින්, සිතින් කර්ම කිරීමේ දී යළි යළිත් නුවණින් විමසා බලා එය සිදු කරන ලෙස පෙළ දහමෙහි නිතර අවධාරණය කර ඇත (අම්බලට්ඨික රාහුලොවාද සුත්ත, ම.නි. II, 132 පිටුව). එහි දී යහපතෙහි යෙදෙන ලෙසත් අයහපතින් මිදෙන ලෙසත් දක්වේ (*අභිත්ථරෙථ කල්‍යාණෙ - පාපා චිත්තං නිවාරයෙ*). දරුවන් හදන දෙමාපියන් විසින් දරුවනට සිදු කළ යුතු යුතුකම් අතර ද පළමුවෙන් ම සඳහන් වන්නේ තම දරුවන් පාපයෙන් මුදවා යහපතෙහි යොදවන ලෙසයි (*පාපා නිවාරෙන්ති, කල්‍යාණෙ නිවෙසෙන්ති*, සිගාල සුත්ත, දී.නි.).

අයහපතින් මිදීම හා යහපතෙහි යෙදීම සඳහා වූ මෙම අනුශාසනාව වූ කලි අප ගෞතම බුදුරදුන්ගේ පමණක් නොව ලොව පහළ වන සියලු බුදුවරුන්ගේ අනුශානාවයි.

*සබ්බපාපස්ස අකරණං - කුසලස්ස උපසම්පදා,*
*සචිත්තපරියොදපනං - එතං බුද්ධානසාසනං.* (ධ.ප.)

යමකු වසලයකු හෝ බ්‍රාහ්මණයකු වීමට බලපාන ප්‍රධාන සාධක වනුයේ ඔහු විසින් කරනු ලබන කර්මයේ ස්වභාවයයි.

*න ජච්චා වසලො හොති - න ජච්චා හොති බ්‍රාහ්මණො,*
*කම්මනා වසලො හොති - කම්මනා හොති බ්‍රාහ්මණො.*

(සු.නි., 653 ගා., වසල සුත්ත,)

යමකු පෙර පින් කර ඇති බව (*පුබ්බෙ ච කතපුඤ්ඤතා*, සු.නි. මංගල සුත්ත) දෙලොව අභිවෘද්ධිදායී මංගල කරුණක් ලෙස දක්වේ. මෙබඳු ස්වභාවයෙන් යුතු කර්මයට සුළු වූවකැයි අවමන් නොකරන ලෙස (*මාවමඤ්ඤෙථ පුඤ්ඤස්ස න මං තං ආගමිස්සති*) ද බුදුසමය අවධාරණය කරයි. පාප කර්ම ඉන් මිදී සැඟවිය හැකි තැනක් මිහිපිට කිසිදු තැනක නැති බව සඳහන් වේ (*න විජ්ජති සො ජගතිප්පදෙසො යත්ථට්ඨිතො මුඤ්චෙය්‍ය පාපකම්මා*, ධ.ප. 127 ගාථාව).

❖ විපාකයන්හි ස්වභාවය අනුව කර්මය කොටස් හතරකට බෙදේ. එනම්,

1. *කණ්හං කණ්හවිපාකං*
   කළු විපාක ඇති කළු කර්ම - (සතර අපායන්හි දුක් විඳීමට හේතුවන කර්ම)
2. *සුක්කං සුක්කවිපාකං*
   සුදුවිපාක ඇති සුදු කර්ම - (සදෙව් ලොව, බඹලොව ඉපදීමට හේතුවන කර්ම)
3. *කණ්හසුක්කං කණ්හසුක්කවිපාකං*
   කළු සහ සුදු යන මිශ්‍ර විපාක ජනිතවන කර්ම (මිනිස් ලොව ඉපදීමට හේතුවන කර්ම)
4. *අකණ්හඅසුක්කං අකණ්හඅසුක්කවිපාකං*
   කළු ද නොවූ සුදු ද නොවූ විපාක දෙන කළු ද නොවූ සුදු ද නොවූ කර්ම
   (නිවන / කර්මක්ෂය හේතු වන කර්ම) (පඨමකම්මසුත්ත, අං.නි.2, 446 පිට චතුක්කනිපාත)

1. **කළු විපාක ගෙනදෙන කළු කර්ම යනු** - මෙලොව ඇතැමෙක් දෝෂ සහිතව (රාගාදි කෙලෙස් සහිතව) කයින් වචනයෙන් සිතින් කර්ම රැස් කරති. මෙලෙස ඔහු කයින් වචනයෙන් සිතින් දෝෂ සහිතව කර්ම රැස් කොට දෝෂ සහිත වූ ලෝකයට උපතක් සඳහා පැමිණෙයි. දුක් සහිත ලොවෙහි උපත ලද ඔහු දුක් සහිත විපාක ස්පර්ශ කරයි. දුක් සහිත ස්පර්ශයන්ගෙන් පහස ලද ඔහු ඒකාන්තයෙන් දුක් වූ ආබාධ සහිත විපාක වේදනා විඳියි. නිරයෙහි සත්වයන් දුක් විඳින්නාක් මෙනි. අනිෂ්ට විපාක ඇති අකුසල කර්ම යයි කියනු ලබන්නේ මෙබඳු කර්මයන්ට ය.

2. **සුදු විපාක ගෙනදෙන සුදු කර්ම යනු** - මෙලොව ඇතැමෙක් නිදෙස් වූ කාය, වචී, මනෝ සංස්කාර රැස් කරති. මෙලෙස නිදෙස් වූ කාය, වචී, මනෝ සංස්කාර රැස් කොට දුක් රහිත ලොවක උපතට පැමිණෙති. දුක් නැති ලොවට පැමිණෙන ඔහු දුක් රහිත විපාක ස්පර්ශ කරයි. නිදුක් ස්පර්ශයන්ගෙන් පහල ලද ඔහු ඒකාන්තයෙන් සැප සහිත වූ ආබාධ රහිත ව සැප වේදනා විඳියි. සුභකිණ්හ දෙවියන් මෙනි. සුදු විපාක ගෙන දෙන සුදු කර්ම යනුවෙන් දැක්වෙන්නේ මෙබඳු කර්මයන්ටයි.

3. **කළු සහ සුදු විපාක ගෙනදෙන කළුසුදු මිශ්‍ර කර්ම යනු** - මෙලොව ඇතැමෙක් සදෙස් වූ ද නිදෙස් වූ ද කාය, වාක්, මනෝ කර්ම රැස් කරති. මෙලෙස සදෙස් සහ නිදෙස් වූ කර්ම තිදෙරින් රැස් කොට දුක් සහිත වූ ද දුක් රහිත වූ ද ලෝකයන්හි උපත ලබති. ඊට අනුරූපව ව කලින් කල දුක් සහිත වූ ද දුක් රහිත වූ ද විපාක වේදනා විඳියි. ඇතැමෙක් මිනිසුන් මෙනි. ඇතැමෙක් වෛමානික දෙවියන් මෙනි. ඉෂ්ට හා අනිෂ්ට විපාක ගෙනදෙන කළු සුදු මිශ්‍ර කර්ම යනුවෙන් දක්වා ඇත්තේ මෙබඳු කර්මයි.

4. **කර්ම ක්ෂය කිරීම සඳහා හේතු වන්නා වූ කළුත් නොවූ සුදුත් නොවූ කර්ම යනු** - මෙලොව කළු විපාක ගෙන දෙන කළු කර්මයන්ගේ ක්ෂය කිරීම සඳහා හේතුවන යම් චේතනාවක් ඇත් ද සුදු විපාක ගෙන දෙන සුදු කර්මයන්ගේ ක්ෂය කිරීම සඳහා හේතුවන යම් චේතනාවක් ඇත් ද කළුසුදු මිශ්‍ර විපාක ගෙන දෙන කළුසුදු මිශ්‍ර කර්මයන්ගේ ක්ෂය කිරීම සඳහා හේතුවන යම් චේතනාවක් ඇත් ද මෙය කර්ම ක්ෂය කිරීම සඳහා හේතුවන කළුත් නොවන සුදුත් නොවන කර්ම යයි කියනු ලැබේ.

භාග්‍යවතුන් වහන්සේ මෙම සතරාකාර කර්මයන් ලොවට දේශනා කරන්නේ තමන් වහන්සේගේ ම විශිෂ්ට ඥානයෙන් දැන ප්‍රත්‍යක්ෂ කොට ගෙන බව උන් වහන්සේ වැඩි දුරටත් අවධාරණය කරති. මෙම කර්ම හතරින් බුදුදහමින් වඩාත් අගය කරන්නේ කර්ම ක්ෂය කිරීම සඳහා හේතුවන කළුත් නොවන සුදුත් නොව කර්ම රැස් කිරීමයි. එය හුදෙක් යමක් රැස් කිරීමක් නොව සංස්කාරවලින් නිදහස් වීමට තම මනසෙහි කුසලතාව දියුණු කරලීමයි. එනම් ප්‍රඥාලෝකයෙන් අවිද්‍යාන්ධකාරය දුරුකොට පුඤ්ඤාභිසංඛාර, අපුඤ්ඤාභිසංඛාර සහ ආනෙඤ්ජාභිසංඛාර යන ත්‍රිවිධ සංස්කාරයන්ගෙන් ම නිදහස්වීමට ක්‍රියා කිරීමයි. තථාගතයන් වහන්සේ වෙතින් හෝ ශ්‍රැතවත් ශ්‍රාවකයකු වෙතින් පටිච්චසමුප්පාද සංඛ්‍යාත, චතුරාර්ය සත්‍ය නිශ්‍රිත ධර්ම ශ්‍රවණය කොට සතර සතිපට්ඨානයෙහි පිහිටා ආර්ය අෂ්ටාංගික මාර්ගය වැඩීම මීට අයත් වේ.

❖ විපාක දෙන කාලය අනුව කර්මය කොටස් හතරකට බෙදේ. එනම්,

1. දිට්ඨධම්මවේදනීය කම්ම - මෙලොව දී ම විපාක දෙන කර්ම
2. උපපජ්ජවේදනීය කම්ම - දෙවන භවයෙහි දී අනිවාර්යයෙන් විපාක දෙන කර්ම
3. අපරාපරියවේදනීය කම්ම - රහත් භාවය දක්වා කවර භවයක හෝ විපාක දෙන කර්ම
4. අහොසි කර්ම - විපාක විඳීමට අවස්ථාවක් නොලැබ අහෝසි වන කර්ම

❖ විපාක දෙන ආකාරය අනුව ද කර්මය කොටස් හතරකට බෙදේ. එනම්,

1. ගරුක කම්ම - දෙවන භවයෙහි අනිවාර්යයෙන් විපාක දෙන බලවත් කර්ම
   (කුසල - ධ්‍යාන, මාර්ගඵල, අකුසල - පංචානන්තරිය කර්ම, නියත මිථ්‍යා දෘෂ්ටිය)
2. ආසන්න කම්ම - මරණාසන්න මොහොතෙහි සිදු කරන ලද කර්ම
3. ආචිණ්ණ කම්ම - නිතර පුරුදු පුහුණු කරන ලද කර්ම
4. කටත්තා කම්ම - කලාතුරකින් / අහම්බෙන් සිදුකරන ලද කර්ම

❖ කර්මය කෘත්‍ය වශයෙන් සතරාකාර වේ. එනම්,

1. ජනක කම්ම - ප්‍රතිසන්ධිය ලබා දෙන කර්ම
2. උපස්ථම්භක කම්ම - ප්‍රතිසන්ධිය ලබා දුන් පසු ඊට උපකාරවත් වන කර්ම
3. උපපීඩක කම්ම - ප්‍රතිසන්ධිය ලබාදුන් පසු ඊට බාධා කරන / එය දුර්වල කරන කර්ම
4. උපඝාතක කම්ම - ජනක කර්ම ශක්තිය සහමුලින් ම නැති කරන කර්ම

❖ කර්මය විපාක දෙන ස්ථාන (භූමි) වශයෙන් සිව්වැදෑරුම් වේ. එනම්,

1. අපාය භූමි - සිව් අපා - (නරක , තිරිසන්, ප්‍රේත, අසුර)
2. කමාවචර සුගති භූමි - සදෙව් ලොව
   (චාතුම්මහාරාජිකය, තාවතිංසය, යාමය, තුසිතය, නිම්මානරතිය, පරනිම්මිතවසවත්ති)
3. රූපාවචර භූමි - රූපාවචර බඹලොව 16
   (බ්‍රහ්මපාරිසජ්ජ, බ්‍රහ්මපුරොහිත, මහාබ්‍රහ්මය, පරිත්තාභ, අප්පමාණාභ, අභස්සර, පරිත්තසුභ, අප්පමාණසුභ, සුභකිණ්ණ, වෙහප්ඵලා, අසඤ්ඤසත්ත, සුද්ධාවාස (අවිහ, අතප්ප, සුදස්ස, සුදස්සී, අකණිට්ඨක)
4. අරූපාවචර භූමි - අරූපාවචර බඹලොව සතර
   (ආකාසානඤ්චායතනය, විඤ්ඤාණඤ්චායතනය, ආකිඤ්චඤ්ඤායතනය, නෙවසඤ්ඤානාසඤ්ඤායතනය)

❖ මරණය සිදු විය හැකි ආකාර සතර

1. අයුක්ඛය - ආයුෂ නිමා වීමෙන් සිදු වන මරණ
2. කම්මක්ඛය - කර්මය නිමාවීමෙන් සිදු වන මරණ
3. උභයක්ඛය - ආයුෂ සහ කර්මය එක විට නිමාවීමෙන් සිදු වන මරණ
4. උපච්ඡේදක - ආයුෂ සහ කර්මය යන දෙක ම තිබිය දී හදිසියේ සිදුවන මරණ

❖ සතර ප්‍රතිසන්ධි

1. අපාය ප්‍රතිසන්ධි
2. කාමසුගති ප්‍රතිසන්ධි
3. රූපාවචර ප්‍රතිසන්ධි
4. අරූපාවචර ප්‍රතිසන්ධි

❖ අකුසල කර්මය යටපත් වන සම්පත්ති සතරකි. එනම්,

1. ගති සම්පත්ති (උපත)
2. උපධි සම්පත්ති (රූ සපුව)
3. කාල සම්පත්ති (කාලය)
4. පයොග සම්පත්ති (උත්සාහය)

❖ කුසල කර්මය යටපත් වන විපත්ති සතරකි. එනම්,

1. ගති විපත්ති
2. උපධි විපත්ති
3. කාල විපත්ති
4. පයොග විපත්ති

කම්මසරික්කතාව :

කම්මසරික්කතාව යනු කරනු ලබන කර්මයන්ට අනුරූප ව විපාක ලැබේ ය යන්නයි. බුදුදහමෙහි මීට අදළ ඉගැන්වීම් නිතර දක්නට ලැබේ. ඉහත සඳහන් බොහෝ කරුණු ඊට දෙස් දෙයි. ඊට තවත් උදහරණ කීපයක් මෙසේ දක්විය හැකි ය.

*අන්නදෙ බලදෙ හොති - වත්ථදෙ හොති වණ්ණදෙ,*
*යානදෙ සුඛදෙ හොති - දීපදෙ හොති චක්ඛුදෙ.*
*සො ච සබ්බදදෙ හොති - යො දදති උපස්සයං,*
*අමතං දදෙ ච සො හොති - යො ධම්මමනුසාසති,* (සං.නි. 1, කිංදද සුත්ත)

(ආහාර දෙන්නේ බලය දෙන්නේ වෙයි. වස්ත්‍ර දෙන්නේ වර්ණය දෙන්නේ වේ. යාන - වාහන දෙන්නේ සැපය දෙන්නේ වේ. පහන් ආලෝකය දෙන්නේ ඇස් දෙන්නේ වේ. යමෙක් නිවසක් දෙන්නේ ද ඔහු සියල්ල දෙන්නේ වේ. යමෙක් ධර්මයෙන් අනුශාසනා කෙරේ ද ඔහු අමෘතය දෙන්නේ වේ.)

කර්මානුරූප ව සසර උපත සිදුවන ආකාරය ද ධර්මයෙහි පැහැදිලි ව විස්තර වේ.

*ගබ්භමෙකෙ උප්පජ්ජන්ති - නිරයං පාපකම්මිනො,*
*සග්ගං සුගතිනො යන්ති - පරිනිබ්බන්ති අනාසවා.*
(ධ.ප. පාපාවග්ග, 11 ගාථාව)

(ඇතැමෙක් මව්කුසින් උපදින අතර පව් කළ අය නිරයට යති. පින් කළවුන් ස්වර්ගයට යන අතර ආශ්‍රව රහිත වූවෝ පිරිනිවන් පාති.)

තවද පව් කරන්නා මෙලොවත් පරලොවත් තැවෙන බවත් දෙලොව ම තැවෙන බවත් (*පාපකාරී උභයත්ථ තප්පති,* ධ.ප.) සඳහන් වේ. පින් කරන්නා මෙලොවත් පරලොවත් සතුටුවන බවත් දෙලොව ම සතුටු වන බවත් දක්වේ (*කතපුඤ්ඤො උභයත්ථ නන්දති,* ධ.ප.). මෙබඳු ස්වභාවයෙන් යුක්ත කර්ම තුළින් ජනිත වන කර්ම ඵලය ක්ෂණික නොලැබෙන බවත් එය කල් යාමෙන් විපාක ලැබෙන බවත් දක්වා ඇත්තේ මෙසේ ය.

*න හි පාපං කතං කම්මං - සජ්ජු ඛීරංව මුච්චති,*
*ඩහං තං බාලමන්වෙති - භස්මච්ඡන්නො'ව පාවකො.* (ධ.ප.)

(කළා වූ පාප කර්මය දෙනගේ තනය ඇල්ලූ විගස කිරි නික්මෙන්නාක් මෙන් එකෙණෙහි ම විපාක නොදෙයි. එය ඔහු දවමින් ගිනි අඟුරක් මෙන් ඔහු පසුපස ගමන් කරයි.)

තවද අකුසල කර්මයෙහි ඊට වඩා බලවත් වූ විපාක කුසල විපාක මගින් යටපත් කළ හැකි බව දක්වේ.

*යස්ස පාපං කතං කම්මං - කුසලෙන පිථීයති,*
*සො ඉමං ලොකං පභාසෙති - අබ්භා මුත්තො'ව චන්දිමා.* (ධ.ප.)

(යමකු විසින් කරන ලද පාප කර්මය කුසලයෙන් වසයි ද වළාකුළින් නික්මෙන සඳ මෙන් මෙලොව එළිය කරයි.).

මෙබඳු තත්ත්වයක් මත පිනට කැමැත්තක් ඇති කරගන්නා ලෙසත් (*තම්හි ඡන්දං කයිරාථ,* ධ.ප.) පිනට බිය නොවන ලෙසත් (*මා පුඤ්ඤස්ස භායී, මා පුඤ්ඤස්සභායී සුත්ත,* ඉතිවුත්තක පාළි) ඊට හේතු පින වනාහි සැපතට නමක් වන නිසා (*සුඛො පුඤ්ඤස්ස වුච්චයො*) බවත් දක්වේ.

කර්මයට විපාක ලැබෙන බව බුදුසමය සඳහන් කළ ද යම් දෙදෙනකු කරන කර්ම සමාන වුව ද ඊට විපාක වශයෙන් ඔවුන් දෙදෙනාට ලැබෙන ඵලය වෙනස් විය හැකි ය. ලෝණඵල සූත්‍රයෙහි මීට නිදසුනක් ඉදිරිපත් වේ. සමාන අකුසල කර්ම කරන පුද්ගලයන් දෙදෙනෙක් සිටිති. ඊට විපාක වශයෙන් එක් අයෙක් අපාගත වෙයි. එසේ වුව ද අනෙක් තැනැත්තා එලෙස අපාගත නොවේ. මීට හේතුව කුමක් දැයි බුදුරදුන් වෙතින් ඇසූ පැනයට උන් වහන්සේගේ පිළිතුර ප්‍රකාශ වූයේ උපමාවකට අනුව ය. සමාන ලුණු කැට දෙකක් ගෙන ඉන් එකක් කුඩා වතුර වීදුරුවකට ද අනෙක් ගඟකට ද දමා දියවෙන්නට ඉඩ සැලසුව හොත් වීදුරුවෙහි ජලය ලුණු රස වන අතර ගඟෙහි වතුරෙහි වෙනසක් නොමැත. වීදුරුවෙහි ජලය ලුණු රස වන්නාක් මෙන් ඇතැමුන් කරන අකුසල කර්ම තුළින් ජනිත වන විපාක නිසා ඔවුන් අපාගත වන අතර තවත් අය ගඟට දැමූ ලුණු කැට තුළින් ගඟෙහි ජලයට වෙනසක් නොවන්නාක් මෙන් අපාගත නොවී සුගතිගාමී වෙති. ඇතැමෙක්

දුගතිගාමී වන්නේ ඔවුන් තුළ පවත්නා කුසලය බලවත් නොවීම නිසා ය. තවෙකෙක් එබඳු ම අකුසලයක් කොට ද සුගතිගාමී වන්නේ ඔවුන් තුළ ඊට වඩා බලවත් කුසල ධර්ම පවත්නා හෙයිනි.

## මහාකම්මවිභංග සූත්‍රය

පුද්ගලයා සිදු කරන කුසලාකුසල කර්මයන්ට අනුරූපව විපාක විඳීම පිළිබඳ අනුශාසනා බුදුසමයෙහි නිතර දක්නට ලැබෙන හෙයින් මෙලෙස කම්මසරික්කතාවක් පිළිබඳව පසුකාලීන සාකච්ඡාවට භාජනය විය. එසේ වුව ද මහාකම්මවිභංග සූත්‍රයට අනුව මෙකී අනුපිළිවෙළ වෙනස් වන අවස්ථා ද පවත්නා බව බුදුසමය අවධාරණය කරයි. ඒ අනුව කර්මයට අනුව විපාක දෙන ආකාර සතරකි. එනම්,

1. අකුසල් කොට දුගතිගාමී වීම - *අභබ්බං අභබ්බාසං*
2. අකුසල් කොට සුගතිගාමී වීම - *අභබ්බං භබ්බාසං*
3. කුසල් කොට සුගතිගාමී වීම - *භබ්බං භබ්බාසං*
4. කුසල් කොට දුගතිගාමී වීම - *භබ්බං අභබ්බාසං*

(මහාකම්මවිභංග සුත්ත, ම.නි.III,)

මෙලෙස සිදු වීමට හේතු වන කරුණු එම සූත්‍රයෙහි වැඩිදුරටත් වේ. එබැවින් කම්මසරික්කතාව එලෙස ම සිදු නොවන අවස්ථා ද ඇති බව අප විසින් වටහා ගත යුතුව ඇත. ඒ අනුව අකුසල් කොට දුගතිගාමී වන අය මෙන් ම අකුසල් කොට සුගතිගාමී වන අය ද ඇති බව බුදුදහමින් පෙන්වා දී තිබේ. එසේ වන්නේ අකුසල් නිසා නොව ඔවුන් විසින් ඊට වඩා ප්‍රබල කුසල දහම් තම ජීවිතයේ අවසාන සමයේ දී හෝ සිදු කර ගන්නා බැවිනි. තව ද කුසල් කොට සුගතිගාමී වන අය මෙන් ම කුසල් කොට දුගතිගාමී වන අය ද සිටින බව අප විසින් අමතක නොකළ යුත්තකි. එසේ වන්නේ තමා විසින් සිදු කරන ලද කුසල හේතුවෙන් නොව ඒ කුසලකර්ම මැඩලන අකුසල කර්ම මරණාසන්න වන විට තමා අතින් සිදුවීම හේතුවෙනි. මෙලෙස කර්මය පිළිබඳ බුදුරජාණන් වහන්සේ තුළ පැවැති පුළුල් දැනුම පිළිබඳව අප දැනුවත් වුවහොත් යමකුගේ ක්‍රියා කලාපය දෙස මතුපිටින් පමණක් බලා ඔහු මරණින් පසු උපදින ලෝකය පිළිබඳ නිගමන දීමට අප ඉක්මන් නොවනු ඇත.

බුදුදහමට අනුව කළු (පාප = අකුසල) කර්ම හා සුදු (පුණ්‍ය = කුසල) කර්ම වශයෙන් කර්මය ප්‍රධාන ප්‍රභේද දෙකකට බෙදේ. එනම් සිත අපිරිසිදුව කරන කර්ම හා සිදු පිරිසිදුව කරන කර්ම වශයෙනි. අපිරිසිදු සිතින් කරන කායික, වාචසික, මානසික ක්‍රියාවන්ට විපාක වශයෙන් දුක තමා පිටුපස ලුහුබඳියි. ගොනා පිටුපස එන කරත්තය මෙන් මහත් වූ බරක් තමා වෙත පැමිණෙයි. පිරිසිදු සිතින් කරන කායික, වාචසික, මානසික ක්‍රියාවන්ට ආනිසංස වශයෙන් සෙවණැල්ලක් හා සමානව තමා පිටුපස යහපත ගමන් කරයි. එය මෙලොවදීත් පරලොවදීත් තමාට උපකාරවත් වෙයි. ධර්මශ්‍රවණය කිරීමෙන් කර්මය පිළිබඳ මෙම අවබෝධය ලද දහම පිළිබඳ විශ්වාසය ඇති කරගත් තැනැත්තා හැකිතාක් දුරට සිත පිරිසිදුව පවත්වා ගෙනිමින් කටයුතු කිරීමට උත්සාහවත් වෙයි.

## මංගල සූත්‍රය

අඛණ්ඩව ධර්මශ්‍රවණයෙහි නිරත වෙමින් නිතර සිත පිරිසිදුව පවත්වා ගැනීමේ ප්‍රතිඵල වශයෙන් තම ජීවිතයෙන් බොහෝ යහපත් දෑ නිරායාසයෙන් ම සිදුවෙයි. මංගල සූත්‍රයෙහි දැක්වෙන්නේ එබඳු යහපත් ක්‍රියාවන් ය.

*අසේවනා ච බාලානං* - අනුවණ අය ඇසුරු නොකිරීම
*පණ්ඩිතානං ච සේවනං* - නුවණැති අය ඇසුරු කිරීම
*පූජා ච පූජනීයානං* - පිදිය යුත්තන් පිදීම
*පතිරූපදේසවාසො ච* - සුදුසු පෙදෙසක වාසය කිරීම
*පුබ්බෙ ච කතපුඤ්ඤතා* - පෙරපින් ඇති බව
*අත්තසම්මා පණිධි ච* - තමසිත පිරිසිදු කර ගැනීම
*බාහුසච්චං ච* - බොහෝ ශාස්ත්‍ර උගත්බව
*සිප්පං ච* - ශිල්ප උගත්බව

| | |
|---|---|
| *විනයො ච* | - විනයවත්බව |
| *සුසික්ඛිතො* | - මැනැවින් හික්මුණු බව |
| *සුභාසිතා ච යා වාචා* | - යහපත් වචන ඇතිබව |
| *මාතාපිතුඋපට්ඨානං* | - මව්පියන්ට උපස්ථාන කිරීම |
| *පුත්තදරස්ස සංගහො* | - අඹුදරුවන්ට සංග්‍රහ කිරීම |
| *අනාකුලා ච කම්මන්තා* | - නිරවුල් කර්මාන්ත ඇති බව |
| *දනං ච* | - දන්දීම |
| *ධම්මචරියා ච* | - ධර්මානුකූල හැසිරීම |
| *ඤාතකානඤ්ච සංගහො* | - ඤාතීන්ට සංග්‍රහ කිරීම |
| *අනවජ්ජානි කම්මානි* | - නිවැරදි කර්මාන්ත |
| *ආරති විරති පාපා* | - පාපයන්ගෙන් වෙන්වීම |
| *මජ්ජපානා ච සඤ්ඤමො* | - මත්පැන්හි හික්මීම |
| *අප්පමාදෙ ච ධම්මෙසු* | - ධර්මයෙහි නොපමාවීම |
| *ගාරවො ච* | - ගරුකළ යුත්තන්ට ගරු කිරීම |
| *නිවාතො ච* | - නිහතමානී බව |
| *සන්තුට්ඨී ච* | - ලද දෙයින් සතුටුවීම |
| *කතඤ්ඤුතා* | - කළගුණ දන්නා බව |
| *කාලෙන ධම්මසවණං* | - සුදුසු කල්හි ධර්මශ්‍රවණය |
| *ඛන්තී ච* | - ඉවසීම |
| *සොවචස්සතා* | - ඇහුන්කම්දීම |
| *සමණානඤ්ච දස්සනං* | - ශ්‍රමණයන් වහන්සේලා දැකීම |
| *කාලෙන ධම්මසාකච්ඡා* | - සුදුසු කල්හි ධර්ම සාකච්ඡාව |
| *තපො ච* | - සිල්වත්බව |
| *බ්‍රහ්මචරියඤ්ච* | - බඹසර හැසිරීම |
| *අරියසච්චානදස්සනං* | - ආර්ය සත්‍යය දැකීම |
| *නිබ්බාණසච්ඡිකිරියා ච* | - නිර්වාණය සාක්ෂාත් කිරීම |
| *පුට්ඨස්ස ලොකධම්මෙහි චිත්තං යස්ස න කම්පති* | - අටලෝ දහම අබියස කම්පා නොවීම |
| *අසෝකං* | - ශෝක නොකිරීම |
| *විරජං* | - කෙළෙස් මල දුරුළීම |
| *ඛේමං* | - නිවීමට පත්වීම |

සිත පිරිසිදු වූ පමණට ඉහත මංගල කරුණු වැඩිපුර නිතිපතා සිදු වෙයි. යමෙකුගේ ජීවිතයෙන් මෙම මංගල කරුණු සිදු වූ පමණට ඔහුගේ ජීවිතයේ සතුට සැනසුම සහනය උදවේ. එබැවින් මෙම කරුණු උතුම් මංගල කරුණු වශයෙන් භාග්‍යවතුන් වහන්සේ පෙන්වා දුන්හ.

## ව්‍යග්ඝපජ්ජ සූත්‍රය

දිනක් බුදුරදුන් වෙත පැමිණ ව්‍යග්ඝපජ්ජ නම් දීඝජාණුකෝලිය පුත්‍රයා බුදුරදුන් වෙතින් ධර්ම කරුණක් විමසා සිටියේ ය. තමා බඳු ගිහිවත් දරන කාමභෝගී ගෘහස්ථ ජීවිත ගත කරන්නෙකුට මෙලොව ජීවිතයේ සාර්ථකත්වයට හේතුවන හා පරලොව ජීවිතයේ යහපතට හේතුවන කරුණු දේශනා කරන ලෙසයි. එහි දී භාග්‍යවතුන් වහන්සේ මෙලොව ජීවිතය සඵල වීමට හේතුවන කරුණු වශයෙන් දේශනා කළේ,

1. *උට්ඨාන සම්පද* - උත්සාහයෙන් මහන්සියෙන් අධ්‍යාපන හා වෘත්තීය කටයුතුවල නියැළීම
2. *ආරක්ඛ සම්පද* - තමා ඉපැයූ ධනය ආරක්ෂා කිරීම
3. *කල්‍යාණ මිත්තතා* - ගුණ නුවණින් සපිරි කලණ මිතුරන්ගේ ඇසුර
4. *සමජීවිකතා* - තමාගේ ආදායමට සරිලන සේ වියදම් කිරීම

පරලොව ජීවිතයේ යහපත සඳහා හේතුවන කරුණු වශයෙන් බුදුරජාණන් වහන්සේ මෙහිදී දේශනා කළේ,

1. *සද්ධා සම්පද* - බුද්ධ, ධම්ම, සංඝ යන තෙරුවන වෙත ඇති ප්‍රසාදය හා විශ්වාසය
2. *සීල සම්පද* - කායික - වාචසික සංවරය
3. *චාග සම්පද* - පරිත්‍යාගශීලීත්වය
4. *පඤ්ඤා සම්පද* - උදයබ්බයගාමිනී පඤ්ඤා - ස්කන්ධාදි ධර්මයන්හි හටගැනීම් නිරුද්ධවීම් දකින නුවණ

'එලූපජීවී පුග්ගල සූත්‍රයට' අනුව සත්ත්වයා ජීවත් වන හේතු හතරක් දක්වේ. එනම්,

1. *කම්මඵලූපජීවී* - කර්ම විපාක නිසා ම ජීවත් වන්නෝ
2. *උට්ඨානඵලූපජීවී* - වීර්යය නිසා ම ජීවත් වන්නේ
3. *කම්මඋට්ඨානඵලූපජීවී* - කර්මය ද වීර්යය ද නිසා ජීවත් වන්නෝ
4. *නෙවකම්ම න උට්ඨානඵලූපජීවී* - කර්මයවත් වීර්යයවත් නැති ව ජීවත් වන්නෝ

කම්මනිදාන සූත්‍රයට අනුව කර්මක්ෂය කිරීම සම්බන්ධ ව සඳහන් වේ. 'ලෝභ, දෝස, මෝහ චේතනා මුල් වී හටගන්නා කර්ම අකුසල නම් වේ. එම කර්ම සාවද්‍යයි, ඒ කර්මවලට දුක් විපාක විඳීමට සිදු වේ. මෙම කර්ම 'කර්මසමුදය' (හටගැනීම) පිණිස පවතී. මේ කර්මයන් කර්ම නිරෝධය පිණිස හේතු නොවේ.' 'අලෝභ, අදෝස, අමෝහ චේතනා මුල් වී හටගන්නා කර්ම කුසලයි. ඒ කර්ම නිරවද්‍යයි වන අතර සැප විපාක ගෙන දේ. එම කර්ම 'කර්මනිරෝධය' පිණිස හේතු වේ. ඒ කර්මයන් **කර්ම සමුදය පිණිස** හේතු නොවේ.'

මෙම සූත්‍රයෙන් ප්‍රකට වන ප්‍රධාන අදහස නම් යළි කර්ම හට ගැනීමට හේතු වන කර්ම (*අභිසංකරණ සංඛාර*) මෙන් ම යළි කර්ම හටනොගැනීමට ද හේතු වන කර්ම (*පයෝගාභිසංඛාර*) පවත්නා බවයි. බුදුසමයෙන් විශේෂයෙන් අවධාරණය කෙරෙන්නේ කර්මක්ෂය කිරීම් සංඛ්‍යාත කර්ම සඳහායි. එනම් නිවන සඳහා හේතු වන කුසල කර්ම කිරීමට මග පෙන්වීමයි. මෙය බුදුදහමට පමණක් සුවිශේෂී වූ ඉගැන්වීමකි. යොනිසොමනසිකාරය අනුව නාමරූප ධර්ම පිළිබඳව නුවණින් විමසා බලා නිවැරදි කුසල ක්‍රියාවන්හි යෙදීමේ හැකියාව මිනිසා සතුව පවතී. චේතනාත්මක ව ක්‍රියා කිරීමේ හැකියාව පුද්ගලයා සතු ව පවත්නා බව බුදුරජාණන් වහන්සේ අවධාරණය කරන හෙයින් උන් වහන්සේ කර්මවාදී හා ක්‍රියාවාදී බව සඳහන් වේ (*සමණො ඛලු භො ගොතමො කම්මවාදී කිරියවාදී,* ම.නි.II)

## සසර

බාහිර ලෝකයක් ඇත ය යන හැඟීමෙන් යුතුව අකුසල් සිදු කළ ද කුසල් සිදු කළ ද අප ජීවත් වන්නේ සංසාර චක්‍රය තුළ ම යි. ඊට හේතුව එම කර්ම අවිද්‍යා පාදකව (*අවිජ්ජා පච්චයා සංඛාරා*) සිදුවීම නිසයි. අවිද්‍යාව මුල් වී පුඤ්ඤාභිසංඛාර සිදු කළ ද අපුඤ්ඤාභි (පාප) සිදු කළ ද ආනෙඤ්ජාභිසංඛාර (අරූප ලෝකයෙහි ඉපදීමට හේතුවන කර්ම) සිදු කළ ද සත්ත්වයාට සසර කතරින් මිදීමක් නොමැත. අප සිදු කරන පාප කර්ම කළු කර්ම (*කණ්හං කණ්හවිපාකං*) වන අතර ඒවා කළු හෙවත් දුක් විපාක ගෙන දීමට හේතුවෙයි. අප සිදු කරන පුණ්‍ය හෙවත් කුසල කර්ම (*සුක්කං සුක්කවිපාකං*) වන අතර ඒවා සැප ආනිසංස ගෙන දෙන සුදු කර්ම වශයෙන් දක්වා තිබේ. වරෙක අකුසලය ද තවත් වරෙක කුසලය ද මුල් වී සිදු කරන කර්ම අකුසල හා කුසල යන විපාක දෙක ම විඳීමට සිදුවන කළු-සුදු කර්ම වශයෙන් දක්වා තිබේ. මෙකී කර්මයන්ට අනුව සසරෙහි සැප හෝ දුක් විපාක ලැබුණ ද සසරින් මිදීමක් නොමැත. සුදු කර්ම සිදු කොට වරෙක සුගතිගාමී වුව ද තවත් වරෙක දුගතිගාමී වීමට ද සිදු වේ. තව ද ජරා, මරණ, ජාති ආදි දුක්වලින් මිදීමක් ද නොමැත. බුදුදහමෙහි දක්වෙන පරිදි මෙම කර්ම තුන ම සිදු කරනු ලබන්නේ අවිද්‍යා පාදකවයි. එනම් තමා වටා නිත්‍ය සැප ආත්ම වූ ලෝකයක් ඇත යන හැඟීමෙන් සිදු කරන කර්ම බැවිනි.

බුදුදහමින් අපව දිරිමත් කරන්නේ කර්මක්ෂය කිරීමට හේතුවන කර්ම හෙවත් කළුත් නොවන සුදුත් නොවන (*අකණ්හ අසුක්කං අකණ්හ අසුක්කවිපාකං*) කර්ම සිදු කරන ලෙසයි. ඒවා පයෝගාභිසංඛාර වශයෙන්

දක්වා තිබේ. ඒ සඳහා පටිච්ච සමුප්පාද පාදක චතුසච්ච සම්මාදිට්ඨියෙන් යුතුව සීල, සමාධි, පඤ්ඤ යන ත්‍රිවිධ ශික්ෂා සම්පූර්ණ කළ යුතුව පවතී. මෙහි දී විශේෂයෙන් ස්කන්ධ, ධාතු, ආයතන, නාමරූප ධර්ම අනිත්‍යාදි වශයෙන් යළි යළිත් නුවණින් මෙනෙහි කිරීම අවශ්‍ය කෙරේ.

නිබ්බේධික පරියාය සූත්‍රයෙහි කර්මය පිළිබඳ විධිමත් විස්තරයක් ඇතුළත් වේ. ඊට අනුව කර්මය තේමා කොට ප්‍රශ්න හයක් මතුකොට ඊට පිළිතුරු සැපයේ. මෙහිදී කර්මය යනුවෙන් දැක්වෙන්නේ සංචේතනාවයි. කර්මයේ නිදානය වශයෙන් සඳහන් වන්නේ ස්පර්ශයයි (*ඵස්සො භික්ඛවෙ කම්මානං නිදාන සම්භවො*). කර්මයේ නිරෝධය ස්පර්ශ නිරෝධයයි (*ඵස්සනිරොධො භික්ඛවෙ කම්මානං නිරොධො*). එබඳු වූ කර්මය නිරෝධ කරන මාර්ගය ලෙස පෙන්නුම් කර ඇත්තේ ආර්ය අෂ්ටාංගික මාර්ගයයි (*අයමෙව අරියො අට්ඨංගිකො මග්ගො කම්මනිරොධගාමිනීපටිපදා*)

කර්මයන්ට අනුරූප ව විපාක ලැබීමක් දක්නට ලැබුණ ද බුදුසමයට අනුව කර්මය කරන්නෙක් හෝ එහි ඵල විඳින්නෙක් හෝ නොමැත. හුදෙක් පවත්නේ ශුද්ධ ධර්ම පමණි.

*කම්මස්සකාරකො නත්ථි* - *විපාකස්ස ච වේදකො,*
*සුද්ධධම්මා පවත්තන්ති* - *එවෙතං සම්මදස්සනං.* (විසුද්ධිමග්ග)

සත්ත්වයා කර්මය දායාද කොට කර්මය ස්වකීය කොට ඇත්තේ නමුදු කර්ම චක්‍රයට ම නතු වී එහි වහලෙකු සේ හිර කොට තැබීමට බුදුසමය උත්සාහ නොකරයි. කර්මය අභිබවා ගොස් කර්මක්ෂය කිරීමේ මාර්ගය බුදුසමයෙහි පැහැදිලි ව දේශනා කොට ඇත. බුදුදහමේ මූලික ඉලක්කය කර්මක්ෂය කොට සත්ත්වයා සසර දුකින් නිදහස් කරවීමයි. සත්වයාට විමුක්තිය ලද හැක්කේ කර්ම බන්ධනයෙන් නිදහස් වීමෙනි. බෝසතුන් මෙලොව උපත ලද මොහොතෙහි 'මේ මාගේ අවසන් ජාතිය බවත් නැවත භවයක් නැති බවත්' (*අයමන්තිමා ජාති නත්ථි'දානි පුනබ්භවො*) ප්‍රකාශ කළේ මෙකී කර්මක්ෂය කිරීම අරභයා ය.

ඒ සඳහා විවේකනිස්සිත ව විරාගනිස්සිත ව නිරොධනිස්සිත ව නිවනට බර ව සත්ත බොජ්ඣංග ධර්ම වඩා තෘෂ්ණාව ක්ෂය කළ යුතු ව පවතී. තෘෂ්ණාව ප්‍රහීණ වීමෙන් කර්මක්ෂය වන අතර කර්මක්ෂය වීමෙන් දුක් ප්‍රහීණ වේ. තෘෂ්ණාව ක්ෂය කිරීමෙන් දුඃඛක්ෂය වන අතර දුඃඛක්ෂය කිරීමෙන් කර්මක්ෂය වන බව ඛය සූත්‍රයෙහි දැක්වේ (*තණ්හාය පහානා කම්මං පහීයති. කම්මස්ස පහානා දුක්ඛං පහීයති. ..... තණ්හක්ඛයා කම්මක්ඛයො. කම්මක්ඛයා දුක්ඛක්ඛයොති*, සං.නි. V (1), 176 පිට). මෙලෙස තෘෂ්ණාව දුරු කිරීමෙන් කර්මක්ෂය කළ යුතු බව බුදුසමයෙහි අනුශාසනාවයි. මේ සඳහා වැඩිය යුතු ප්‍රධාන ප්‍රතිපදාව ලෙස බුදුදහමින් දැක්වෙන්නේ සතර සතිපට්ඨානයයි.

ඔබ සැමට තෙරුවන් සරණයි !

එක්සත් ජනපදයේ කොවිනාහි ලොස් ඇන්ජලිස් බෞද්ධ විහාරස්ථානයේ

**දසදින සූත්‍රධර්ම විවරණ වැඩසටහන 03 වන දේශනය**

(2020 දෙසැම්බර මස 04 වන සිකුරාදා) (UD)

# *Cullakammavibhanga Sutta*
## Shorter Analysis of Deeds
(Translated by Bhikkhu Sujato)

So I have heard. At one time the Buddha was staying near Sāvatthī in Jeta's Grove, Anāthapiṇḍika's monastery.

Then the brahmin student Subha, Todeyya's son, approached the Buddha, and exchanged greetings with him. When the greetings and polite conversation were over, he sat down to one side and said to the Buddha:

"What is the cause, Master Gotama, what is the reason why even among those who are human beings some are seen to be inferior and superior? For people are seen who are short-lived and long-lived, sickly and healthy, ugly and beautiful, insignificant and illustrious, poor and rich, from low and eminent families, witless and wise. What is the reason why even among those who are human beings some are seen to be inferior and superior?"

"Student, sentient beings are the owners of their deeds and heir to their deeds. Deeds are their womb, their relative, and their refuge. It is deeds that divide beings into inferior and superior."

"I don't understand the meaning of what Master Gotama has said in brief, without explaining the details. Master Gotama, please teach me this matter in detail so I can understand the meaning."

"Well then, student, listen and pay close attention, I will speak."

"Yes, sir," replied Subha. The Buddha said this:

"Take some woman or man who kills living creatures. They're violent, bloody-handed, a hardened killer, merciless to living beings. Because of undertaking such deeds, when their body breaks up, after death, they're reborn in a place of loss, a bad place, the underworld, hell. If they're not reborn in a place of loss, but return to the human realm, then wherever they're reborn they're short-lived. For killing living creatures is the path leading to a short lifespan.

But take some woman or man who gives up killing living creatures. They renounce the rod and the sword. They're scrupulous and kind, living full of compassion for all living beings. Because of undertaking such deeds, when their body breaks up, after death, they're reborn in a good place, a heavenly realm. If they're not reborn in a heavenly realm, but return to the human realm, then wherever they're reborn they're long-lived. For not killing living creatures is the path leading to a long lifespan.

Take some woman or man who habitually hurts living creatures with a fist, stone, rod, or sword. Because of undertaking such deeds, after death they're reborn in a place of loss … or if they return to the human realm, they're sickly …

But take some woman or man who does not habitually hurt living creatures with a fist, stone, rod, or sword. Because of undertaking such deeds, after death they're reborn in a heavenly realm … or if they return to the human realm, they're healthy …

Take some woman or man who is irritable and bad-tempered. Even when lightly criticized they lose their temper, becoming annoyed, hostile, and hard-hearted, and displaying annoyance, hate, and bitterness. Because of undertaking such deeds, after death they're reborn in a place of loss … or if they return to the human realm, they're ugly …

But take some woman or man who isn't irritable and bad-tempered. Even when heavily criticized, they don't lose their temper, become annoyed, hostile, and hard-hearted, or display annoyance, hate, and bitterness. Because of undertaking such deeds, after death they're reborn in a heavenly realm … or if they return to the human realm, they're lovely …

Take some woman or man who is jealous. They envy, resent, and begrudge the possessions, honor, respect, reverence, homage, and veneration given to others. Because of undertaking such deeds, after death they're reborn in a place of loss … or if they return to the human realm, they're insignificant …

But take some woman or man who is not jealous … Because of undertaking such deeds, after death they're reborn in a heavenly realm … or if they return to the human realm, they're illustrious …

Take some woman or man who doesn't give to ascetics or brahmins such things as food, drink, clothing, vehicles; garlands, perfumes, and makeup; and bed, house, and lighting. Because of undertaking such deeds, after death they're reborn in a place of loss … or if they return to the human realm, they're poor …

But take some woman or man who does give to ascetics or brahmins … Because of undertaking such deeds, after death they're reborn in a heavenly realm … or if they return to the human realm, they're rich …

Take some woman or man who is obstinate and vain. They don't bow to those they should bow to. They don't rise up for them, offer them a seat, make way for them, or honor, respect, esteem, or venerate those who are worthy of such. Because of undertaking such deeds, after death they're reborn in a place of loss … or if they return to the human realm, they're reborn in a low class family …

But take some woman or man who is not obstinate and vain … Because of undertaking such deeds, after death they're reborn in a heavenly realm … or if they return to the human realm, they're reborn in an eminent family …

Take some woman or man who doesn't approach an ascetic or brahmin to ask: 'Sir, what is skillful and what is unskillful? What is blameworthy and what is blameless? What should be cultivated and what should not be cultivated? What kind of action will lead to my lasting harm and suffering? Or what kind of action will lead to my lasting welfare and happiness?' Because of undertaking such deeds, after death they're reborn in a place of loss … or if they return to the human realm, they're witless …

But take some woman or man who does approach an ascetic or brahmin to ask: 'Sir, what is skillful and what is unskillful? What is blameworthy and what is blameless? What should be cultivated and what should not be cultivated? What kind of action will lead to my lasting harm and suffering? Or what kind of action will lead to my lasting welfare and happiness?' Because of undertaking such deeds, when their body breaks up, after death, they're reborn in a good place, a heavenly realm. If they're not reborn in a heavenly realm, but return to the human realm, then wherever they're reborn they're very wise. For asking questions of ascetics or brahmins is the path leading to wisdom.

So it is the way people live that makes them how they are, whether short-lived or long lived, sickly or healthy, ugly or lovely, insignificant or illustrious, poor or rich, in a low class or eminent family, or witless or wise.

Sentient beings are the owners of their deeds and heir to their deeds. Deeds are their womb, their relative, and their refuge. It is deeds that divide beings into inferior and superior."

When he had spoken, Subha said to him, "Excellent, Master Gotama! Excellent! As if he were righting the overturned, or revealing the hidden, or pointing out the path to the lost, or lighting a lamp in the dark so people with good eyes can see what's there, Master Gotama has made the Teaching clear in many ways. I go for refuge to Master Gotama, to the teaching, and to the mendicant Saṅgha. From this day forth, may Master Gotama remember me as a lay follower who has gone for refuge for life."

(Translated by Bhikkhu Sujato)